**සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව - 2017 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31**

**සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ 2017 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය නීතිගත සංස්ථා පනත හා 2007 අංක 07 දරණ සමාගම් පනත සමග කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2017, 2018, 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි සඳහන් කරන සමාගමේ ක්‍රියාකාරීත්ව සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

## 1.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (SLFRS for SMEs) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මණ්ඩලයේ වගකීම වේ.**

### 1.1.1 මූල්‍ය ප්‍රකාශන

### 1.1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2003 ජුනි 02 දිනැති හා අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තිය පරිදි ගිණුම් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් 2017, 2018, 2019 හා 2020 වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.**<br><br>**තවද ආයතනය විසින් භාවිතා කරනු ලැබූ පරිගණක සර්වර් යන්ත්‍රය අක්‍රීය වීමෙන් පසුව 2019 වර්ෂයේ ජූලි මාසයේ දී රු.282,000ක මුදලකට මිලදීගත් නව සර්වර් යන්ත්‍රය 2021 ජනවාර් 30 දින ස්ථාපිත කර තිබුණද සර්වර් යන්ත්‍රය අක්‍රීය වන අවස්ථාවේදී උපස්ථ (Backup) තබා නොගැනීම හේතුවෙන් ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය තොරතුරු විනාශ වූ බව දක්වමින් 2017 වර්ෂයේ සිට 2020 දක්වා ගිණුම් වර්ෂයන්ට අදාළ ගිණුම් වාර්තා පිළියෙල කර නොතිබුණි.** | **මේ දක්වා ඉදිරිපත් කර නොමැත.** | **චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.** |

## 1.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.2.1 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්මන් මූල්‍ය දුෂ්කරතා ජයගනිමින් සීඝ්‍රයෙන් වර්ධනය වන ඉදිකිරීම් කර්මාන්තයේ ශක්තිමත් පාර්ශවකරුවකුවීමට ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට ඉවහල්වනු පිණිස භාණ්ඩාගාර ඇපයක් මත 2018 මාර්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් ලංකා බැංකුව විසින් රුපියල් මිලියන 500ක ණය මුදලක් 2018 සැප්තැම්බර් 28 දින සංස්ථාව වෙත ලබා දී තිබුණි. ඉන් බැංකුවට අයවීමට ඇති රු.199,052,329ක මුදල අඩුකර ගෙන ලබා දුන් ඉතිරි මුදල වන රු.301,377,920 න් 21%ක පමණ මුදලක් වූ රු.105,977,098ක් ණය ලබා ගැනීමේ අරමුණට පටහැනිව වියදම් කර තිබුණි.<br>මෙම ණය මුදල පියවීමට සංස්ථාව විසින් අපොහොසත් වී තිබූ අතර 2021දෙසැම්බර් 31 දිනට හිඟ පොළී වාරික මුදල රු.102,408,382ක් විය. | අදහස් දක්වා නොමැත. | ණය ලබා ගැනීමේ කොන්දේසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. |
| (ආ) | 2004 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා සේවක අර්ථසාධක අරමුදල් නියමිත පරිදි නොගෙවීම නිසා අධිකරණ නියෝග මත රු.3,982,512ක අධිභාරයක් ගෙවිය යුතු වූ අතර පාරිතෝෂිත මුදල් 2006 ජුනි 16 දිනට ගෙවිය යුතු වුවත් නියමිත දිනට නොගෙවීම නිසා අධිකරණ නියෝග මත රු.79,191 ක අධිභාරයක් ද ගෙවිය යුතු විය. | අදහස් දක්වා නොමැත. | අර්ථසාධක අරමුදල් නියමිත පරිදි ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **අධිකරණ නියෝග මත ගෙවිය යුතු ගෙවීම්**<br>පාර්ශවයන් 2ක් සඳහා අධිකරණ නියෝග මත සංස්ථාව විසින් ගෙවිය යුතු රු.24,026,959ක මුදලින් තවදුරටත් ගෙවිය යුතු මුදල රු.10,626,959 ක් විය. | අදහස් දක්වා නොමැත. | අධිකරණ නියෝගයන්ට අනුගතව කටයුතු කළ අතර නීතිමය පියවර ගැනීමට පෙර සැපයුම්කරුවන්ට මුදල් ගෙවීමට වගබලා ගත යුතු වේ. |

**1.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | | | |
| (i) **4.2.6 ඡේදය** | කාර්තුමය, අර්ධ වාර්ෂික, වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයට කාර්තුව අවසන් වී දින 30 කට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) **4.3 ඡේදය** | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ රේඛීය අමාත්‍යාංශය වෙත දින 10 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 වර්ෂයේ අදාල තීරණ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) **7.4.1 ඡේදය** | අවම වශයෙන් මාස 03 කටවත් වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් බැගින් පැවැත්විය යුතු වුවද, 2017 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දින දක්වාම කිසිදු විගණන හා කළමනාකරණ රැස්වීමක් පවත්වා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iv) **8.2.2 ඡේදය** | ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කිරීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගත යුතු වුවද 2015 හා 2016 වර්ෂවලදී තැන්පත් කරන ලද රුපියල් මිලියන 24ක්වූ ස්ථාවර තැන්පතු හා 2019 ආයෝජනය කරන ලද රුපියල් මිලියන 120ක ආයෝජන සම්බන්ධයෙන් එවැනි එකඟතාවයක් ලබා ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(v)** | **8.3.3 (අ)** වගන්තිය | ප්‍රසාද දීමනා ගෙවීමට සුදුසුකම් ලැබීම සඳහා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන එම වර්ෂය අවසන් වී දින **60**ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවද, **2017, 2018, 2019** හා **2020** යන වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ දින තෙක්ම ඉදිරිපත් කර නොතිබුණද **2017, 2018, 2019** යන වර්ෂයන්හි ප්‍රසාද දීමනා වශයෙන් රු.**1,550,264**ක මුදලක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| **(vi)** | **9.2 (ආ)** ඡේදය | සංස්ථාවට අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| **(vii)** | **9.3.1 (i) (vi) (vii)** | ලබාගත යුතු නිසි අනුමැතිය ප්‍රකාරව පිළියල කළ බඳවා ගැනීමේ පරිපාටියක් සංස්ථාව සතුව නොතිබුණු අතර තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා ඉඩ ලබා නොදිය යුතු වුවද, නොවැලැක්විය හැකි හේතුවක් මත එසේ ලබා දුන්නද එය මාස **03**ක කාලයක් නොඉක්මවිය යුතුය. එසේ වුවද විධායක ශ්‍රේණියේ තනතුරක් වර්ෂයකට වැඩි කාලයක සිට රාජකාරි ආවරණ කිරීම් යටතේ යොදවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | **2016** මාර්තු **31** දිනැති අංක **05/2016** දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ **3.2.6** ඡේදය හා **3.2.7** ඡේදය | එක් එක් වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඊළඟ වර්ෂයේ ජුනි **30** දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඒ බව ජුනි **30** දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂකට දැනුම් දිය යුතු වුවත් **2017, 2018** හා **2019** හා **2020** වර්ෂයන් සඳහා විගණන දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක **MF/CG/02/(Cir)** හා **2017** ජුනි **28** දිනැති නිකුත් කර ඇති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක **01/2017** | ආයතනය විසින් කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "ප්‍රමිතියට අනුකූලව උසස් ගුණාත්මකභාවයෙන් යුක්ත ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ තරඟකාරී මිලකට දීප ව්‍යාප්තව සැපයීමේ ප්‍රමුඛයා වීම හා රාජ්‍ය ආයතනයක් ලෙස සමාජ වගකීම් ඉටු කරමින් ශ්‍රී ලංකා ප්‍රජාව තුළ උපරිම විශ්වාසනීයත්වයක් ගොඩනැගීම" ආයතනයේ දැක්ම විය. එසේ වුවද වර්තමානය වන විට ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ නවීකරණය කරන ලද ප්‍රදර්ශනාගාරයේ සහ ශාඛා කාර්යාලයන්හි පෞද්ගලික ගොඩනැගිලි ද්‍රව්‍ය උපකරණ සපයන්නන්ගෙන් මිලදී ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ ලාභ ආන්තිකයක් ඇතිව විකිණීම යන කටයුතුවල නිරත වන අතර මේ අනුව සංස්ථාව පිහිටුවීමේ අරමුණු හා සංස්ථාවේ දැක්මද ආවරණය නොවන බව නිරීක්ෂණය විය. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් වූ 2013 ,2016 දක්වා වූ වර්ෂ 04ක කාලය තුළදී ද ශුද්ධ අලාභය රුපියල් මිලියන 15 සිට රුපියල් මිලියන 94 දක්වා වැඩිවී තිබුණි. | අදහස් දක්වා නොමැත. | සංස්ථාවේ අරමුණු හා දැක්ම කෙරෙහි අවධානය යොමු කරමින් අලාභය අවම කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

### 2.2 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය වන විට සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට එරෙහිව අධිකරණයන්හි නඩු 13 ක් විභාග වෙමින් පැවතුණි. | අදහස් දක්වා නොමැත. | නීතිමය කටයුතු වලට නොයන පරිදි ආයතනය කටයුතු කළ යුතුය. |

### 2.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ 10 සංඝරාජ මාවතේ පිහිටි රූඩ් 04 පර්චස් 31.4ක්වූ ඉඩම්කැබලි 03ක ප්‍රමාණයක් සඳහා රුපියල් මිලියන 222.50ක මුදලක් විකුණුම් ඔප්පු මගින් සංස්ථාව ලබා ගෙන තිබුණි. 2012 ජනවාරි 31 දිනට පෙර රු.359.32ක මුදලක් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (HDFC) වෙත ගෙවා ඉඩම්වල අයිතිය නිදහස් කර ගැනීමට කොළඹ දිසා | අදහස් දක්වා නැත. | අදාළ මුදල නිරවුල් කර ඉඩම නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධිකරණයේ නඩු තීන්දුවකින් තීරණය වී ඇතත් සංස්ථාව එසේ නොගෙවීමෙන් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් ඉඩම්වල නිරවුල් භුක්තිය ලබා ගැනීමට ක්‍රියා කරනු ලබන බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | ශ්‍රී සංඝරාජ මාවත කොළඹ 10 පිහිටි සංස්ථාව සතු ඉඩමෙන් පර්චස් 100ක ප්‍රමාණයක් ලංකා බැංකුව වෙත රුපියල් මිලියන 70කට විකුණුම්කරයක් මගින් පවරා තිබූ අතර, පසුව සංස්ථාව විසින් 2018 ඔක්තෝබර් මස 23 දින ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද රුපියල් මිලියන 500ක ණය මුදලින් මෙම මුදල සමග ණය අයිරා මුදලද ගෙවිය යුතු පොළිය ද ඇතුළුව රු.199,052,329ක මුදලක් හිලව් කරගෙන සකස් කර එවා ඇති ඔප්පුවේ වටිනාකමකට අදාල මුද්දර ගාස්තුව වූ රු.5,383,174ක මුදල ගෙවා නැවත ඉඩම පවරාගත යුතු වුවත්, 2021 නොවැම්බර් 01 දින වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | අදාළ මුද්දර ගාස්තුව ගෙවා ඉඩම නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නො. 417/ඒ, කඩේ වීදිය නැගෙනහිර, දුම්රිය පොළ පාර මාතර ඉඩමෙන් රූඩ් 01 පර්චස් 2.8ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අනවසරයෙන් පරිහරණය කරන අතර ආයතනය ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදහස් දක්වා නැත. | වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් සංස්ථාව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | සංස්ථාව යටතේ ඇති අක්කර 05 රූඩ් 02 පර්චස් 12ක්වූ ඉඩම් හා නිවාස 05ක් සඳහා මෙතෙක් ඔප්පු ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | ඔප්පු ලබා ගැනීමට සංස්ථාව ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | අක්කර 02 රූඩ් 03 පර්චස් 14.5ක්වූ ඉඩම් 09ක් සඳහා මිනින්දෝරු සැලැසුම් නොතිබුණි. | අදහස් දක්වා නැත. | මිනින්දෝරු සැලසුම් සකස් කරවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඊ) | අංක 549/A, බොරුපන, මොරටුව ඉඩමේ පැවරුම ලබා ගැනීම සඳහා 2019 අගෝස්තු 21 වන දිනැතිව සහ අංක අමප/19/2192/122/076 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඉඩමේ අයිතිය ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත ලබා දීමට අනුමැතිය ලබා දී ඇතත් සංස්ථාව විසින් ඉඩමේ අයිතියට අදාළ ඔප්පුව ලියා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | ඔප්පුව ලියා ගැනීමට සංස්ථාව කටයුතු කළ යුතුය. |
| (උ) | සංස්ථාව සතු නො 325 ශ්‍රී පොන්නම්බලම් පාර යාපනය පිහිටි රූඩ් 01 යි පර්චස් 31.6 ඉඩම, පණ්ඩුගම අනුරාධපුර නිවාස, නුවර එළිය බඹර කැලේ ගොඩනැගිල්ල, ඇඹිලිපිටිය යෝධගම නිවාස 02 පරිහරණය නොකරන බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | ඉඩම ආරක්ෂා කර ගැනීමට මෙන්ම උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවා කටයුතු සඳහා අංක 541 ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි සංස්ථා පරිශ්‍රයේ ගබඩා අංක 1,2,3,4,5,6 සහ 7 යන ගබඩා කුලියට ලබා දී තිබුණද ගිවිසුම අළුත් කිරීමකින් තොරව 2015,2016,2017 වර්ෂවල මිලටම 2020 වර්ෂයේ ද එම ගබඩා කුලියට ලබා දී තිබුණි. තවද මෙම ගබඩා සඳහා 2018 ජුලි සිට 2021 ජනවාරි  දක්වා ගෙවිය යුතු රු.60,382ක් වූ විදුලි බිල්පත් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ගෙවා නොතිබුණි. | අදහස් දක්වා නැත | වත්කම් තක්සේරු කර ඒ අනුව ගබඩා කුලියට දිය යුතුය. |
| (එ) | සංස්ථාව සතු ගොඩනැගිල්ලක් මාතර ලංකා සතොස අලෙවි සැල සඳහා ලබා දී තිබූ අතර 2019 ජූලි මස සිට එම ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව ඇත. | අදහස් දක්වා නැත | වත්කම් පූර්ණ උපයෝජනයට ලක් කළ යුතුය. |
| (ඒ) | සංඝරාජ ප්‍රදර්ශනාගාරය තුළ වර්ග අඩි 500 ක් පෞද්ගලික ආයතනයට කුළී පදනම මත ලබා දී තිබූ අතර, එම ආයතනය 2020 ජනවාරි 23 දින ප්‍රදර්ශනාගාරයෙන් ඉවත් වී තිබුණි. එම ආයතනය කුලී මුදල් රු.192,500 සහ විදුලි බිල්පත් සඳහා රු.4,196ක් ගෙවා නොතිබුණි. | අදහස් දක්වා නැත | වත්කම් පූර්ණ උපයෝජනයට ලක් කළ යුතුය. තවද, හිඟ මුදල් අයකර ගත යුතු විය. |
| (ඔ) | 2015 අප්‍රේල් මස සිට වර්ග අඩියක් රු.45 බැගින් වර්ග අඩි 1480 ක් මසකට රු.66,600 ක මුදලකට පෞද්ගලික  පාර්ශවකරුවකු වෙත අංක 541 ශ්‍රී සංඝරාජ මාවතේ සංස්ථා පරිශ්‍රයේ සංස්ථාව සතු ගබඩාවක් ලබාදී තිබුණි. ගිවිසුම් කාලය 2017 අප්‍රේල් 09 දින දක්වා වූ අතර නව ගිවිසුමකට එළඹීමකින් තොරව මුල් ගිවිසුම අනුව මේ දක්වාම එම කුලී මුදලටම ලබා දී තිබුණි. | අදහස් දක්වා නැත | වත්කම් තක්සේරු කර ඒ අනුව ගබඩා කුලියට දිය යුතුය |
| (ඕ) | ජාතික යොවුන් සේනාංක (National Youth Corps) ආයතනය වෙත මසකට රු.164,850 කට ලබා දී තිබූ මාලිගාව පාර රත්මලාන පිහිටි ගොඩනැගිල්ල 2019 ඔක්තෝබර් මස සිට නිෂ්ක්‍රීයව පැවතිණි.<br><br>මේ අනුව මෙවන් මූල්‍ය අර්බුදයක සංස්ථාව පත්ව ඇති තත්ත්වය හමුවේ මෙම ගොඩනැගිලි කුලී මගින් ආදායම වර්ධනය කර ගැනීමට සංස්ථාව අවධානය යොමු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | වත්කම් පූර්ණ උපයෝජනයට ලක් කළ යුතුය. |
| (ක) | වාහන අංක 227-3173 දරන ලොරි රථය 2014 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබූ අතර, දැනට දිරාපත් වෙමින් පරිශ්‍රයේ නවතා තිබුණි. | අදහස් දක්වා නොමැත | මෙම වාහන උපයෝජනයට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ග) | 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාව සතුව වාහන 14ක් තිබූ අතර මෙම වාහනවලින් වාහන 07ක් ධාවන තත්ත්වයේ නොතිබුණි. | අදහස් දක්වා නොමැත | වාහන ධාවන තත්ත්වයට පත්කිරීමට කටයුතු කළ යුතුය. |

**2.4** බැංකු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් බැංකු ගිණුම් 09 ක් පවත්වාගෙන යනු ලබන අතර 2020 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 05ක බැර ශේෂය රු.46,752,693ක්වූ අතර බැංකු ගිණුම් 04ක හර ශේෂය රු.37,813,477ක් විය. 2020 වර්ෂය සඳහාම කිසිදු බැංකු ගිණුමක් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | බැංකු සැසඳුම් මාසිකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉහත බැංකු ගිණුම් 09ට අමතරව 2014 වර්ෂයේ සහ 2015 වර්ෂයේ සිට බැංකු ගිණුම් 2ක් නිශ්ක්‍රීයව පැවතියද එම ගිණුම් වසා දැමීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අක්‍රීය බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුවේ බැංකු ගිණුම් 04 කින් අගය රු.37,813,477ක්වූ අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | බැංකු ගිණුම්වලින් අයිරා පහසුකම් ලබා නොගත යුතුය. |

**3.** ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

**3.1** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද වාර්ෂික අයවැය ලේඛනය සමග අයවැයගත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2** සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සමාගමේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් හා ඊට අනුරූපීව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර සෑම මුදල් වර්ෂයක් ආරම්භවීමට දින 15 කට පෙර අදාළ සැලසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |